# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/41 - 2016 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2016.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47-V

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6 (2) (ආ) සහ 21 (2) (ආ) වැනි වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6 (2) (ආ) වගන්තිය සහ 21 (2) (ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, මේ නියමය මගින්

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වෙන ''හාතාගල රජමහා විහාර භූමි ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ ''හාතාගල රජමහා විහාර භූමි ප්‍රදේශය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***හාතාගල රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේයර් ජනරාල්ගේ 2016 මාර්තු මස 10 වන දින අංක H/AMB/2016/44 දරන අනුරේඛනයේ නිරූපිත දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ පල්ලේකණුකැටිය, හාතාගල සහ මිණිඇතිලිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හෙක්ටයාර් 4.820 ක (අ. 11, රූ. 03, පර්. 25.68) ක් විශාලත්වයෙන් යුක්ත පහත දක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

මායිම් උපලේඛනය

| | | |
|---|---|---|
| උතුරට | : | අ.ග.පි. 460 හි කැබලි අංක 42.$41^{AC}$ $41^{AD}$ සහ $41^{AE}$ ; |
| නැගෙනහිරට | : | අ.ග.පි. 460 හි කැබලි අංක $41^{AA}$.$41^{V}$ අ.ග.පි. 469 හි කැබලි අංක $1^{A}$.1, 22 සහ ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| දකුණට | : | අ.ග.පි. 469 හි කැබලි අංක $1^{J}$.$1^{E}$ $2^{U3}$ $2^{U}$, $2^{UI}$ සහ 13 ; |
| බස්නාහිරට | : | කච්චිගල් ආර. |

10 - 1773


1A - G 24374 — 32 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*